කිඹුලා සහ හිවලා

කුකුළා සහ හිවලා

රුසියන් ජන කතාවක් ඇසුරෙන්
ඒ. එන් නොල්ස්නෝයි විසින්
සකස් කරන ලදී



අලෙක්සෙයි නිකොලාවියෙච් තොල්ස්තෝයි

කුකුළා සහ හිවලා

සිතුවම් - එව්ජිනී මිහයිලොවිච් රචෙව්

රුසියානු බසින් මුද්‍රණය - රාදුගා ප්‍රකාශකයෝ මොස්කව්, 1979
ශ්‍රී ලංකාවේ මුද්‍රණය - කඩුල්ල ප්‍රකාශන, 2023

www.kadullabooks.com

ISBN -978-624-5509-33-1

3+

එකෝමත් එක රටක පූසෙකුයි, කුරුල්ලෙකුයි, කුකුළෙකුයි හිටියා. කැලයක් ළඟ පැලක මේ තුන්දෙනා ජීවත් වුණා. පූසයි, කුරුල්ලයි ගස් කපන්ට කැලේට යන්න ලෑස්තිවෙලා කුකුළාට මෙහෙම කීවා:

"අපි බොහොම දුර ගමනක් යනවා. උඹ ගෙදරදොර බලා කියාගෙන ඉඳපන්. හිවලා එනව දක්කොත් සද්ද නොකර, ජනේලෙන් එළියට බෙල්ල දාන්නෙ නැතුව ඉඳපන්."

පූසයි, කුකුළයි ගෙදර නැති බව හිවලා දැනගත්තා. ඉතින් උඟ දුවගෙන දුවගෙන ඇවිල්ලා, පැල ළඟ වාඩිවෙලා, සින්දුවක් කියන්ට පටන් ගත්තා:

"රන් කුකුළෝ, රන් කුකුළෝ
දිලිසෙන පොඩි හිසක් ඇතේ.
තද රතු කරමලක් ඇතේ
ආදර මගෙ රන් කුකුළෝ
එබී බලන්නකෝ පොඩියක්
මෙන්න උඹට මුං ගුලියක්!"

කුකුළා ජනේලෙන් එළියට බෙල්ල දමලා වට පිට බැලුවා. හිවලා, කුකුළා අල්ලා ගෙන ගුහාව පැත්තට දුවනවා. කුකුළා බයවෙලා කෑගහන්ට පටන් ගත්තා:

"හිවල් හාමි කපටියා
මාව අරන් දුවනවා
කැලේ මැදින් දුවනවා
ගඟෙන් එතෙර දුවනවා



කඳු අතරින් පනිනවා
කුරුළු හාමි, බළල් හාමි
මාව බේරගනිල්ලා!"

කුකුළා අඬන හැටි පූසටයි, කුරුල්ලටයි ඇහුනා. දුවගෙන ගිහිල්ලා හිවලාගෙන් කුකුළා බේරගත්තා.

ඊළඟ දවසෙත් කැලේට යන්න ලෑස්තිවෙලා කුකුළාට කතා කරලා මෙහෙම කීවා:

"මීට පස්සෙවත් ජනේලෙන් එළියට බෙල්ල දාන්නෙ නැතුව ඉඳපන්. අපි බොහොම දුර යන හින්දා උඹ කෑගැහුවත් අපට ඇහෙන්නෙ නැතුව යාවි."

පූසයි, කුරුල්ලයි ගියා විතරයි, හිවලා ආයෙමත් පැල ළඟ වාඩිවෙලා සින්දුවක් කියන්ට පටන් ගත්තා:

"රන් කුකුළෝ, රන් කුකුළෝ
දිලිසෙන පොඩි හිසක් ඇතේ
තද රතු කරමලක් ඇතේ
ආදර මගෙ රන් කුකුළෝ

එබී බලන්නකොා පොඩියක්
මෙන්න උඹට මුං ගුලියක්!"

කුකුළා සද්ද නොකර හිටියා. හිවලා තවත් සින්දුවක් කීවා:

"කොල්ලොා කෙල්ලොා ඇවිල්ලා
සෑම තැනම වී ඉහලා
කිකිළියොා ඒවා කෑවා
රන් කුකුළට නැහැ කීවා".

කුකුළා බෙල්ල එළියට දමලා හඬලෑවා:
"කොක්කොා කෝ කෝ – ඇයි ද අපට නොදෙන්නේ?"
හිවලා කුකුළා අල්ලාගෙන ගුහාව පැත්තට දුවනවා.
කුකුළා කෑගහනවා:

"හිවල් හාමි කපටියා
මාව අරන් දුවනවා
කැලේ මැදින් දුවනවා
ගහෙන් එතෙර දුවනවා



කඳු අතරින් පනිනවා
කුරුළු හාමි, බළල් හාමි
මාව බේරගනිල්ලා!"

කුකුළා කෑගහන හැටි පූසටයි, කුරුල්ලටයි ඇහුනා. පූසා දුවනවා. කුරුල්ලා පියාසර කරනවා. හිවලාව අල්ලාගෙන පූසා උඟ පහුරුගෑවා. කුරුල්ලා උඟට හොටෙන් ඇන්නා. දෙදෙනා කුකුළාව බේරගත්තා.

ටික දවසකට පස්සේ පූසයි, කුරුල්ලයි ආයෙමත් ගස් කපන්ට කැලේට යන්න ලෑස්තිවෙලා කුකුළාට කතා කරල මෙහෙම කීවා:

"හිවලගෙ කපටි බසට රැවටෙන්න එපා. ජනේලෙන් එළියට බෙල්ල දාන්න එපා. අපි අද හුඟාක් දුර ගමනක් යනවා. උඹ කෑගැහුවට අපට ඇහෙන්නෙ නැතුව යාවි."

පූසයි කුරුල්ලයි මූකළන් කැලෑවට ගියා ගස් කපන්න.

හිවලා දුවගෙන දුවගෙන ඇවිල්ලා පැල ළඟ වාඩිවෙලා සින්දුවක් කියන්ට පටන් ගත්තා:

"රන් කුකුළෝ, රන් කුකුළෝ
දිලිසෙන පොඩි හිසක් ඇතේ
තද රතු කරමලක් ඇතේ
ආදර මගෙ රන් කුකුළෝ
එබී බලන්නකෝ පොඩියක්
මෙන්න උඹට මුං ගුලියක්!"

කුකුළා සද්ද නොකර උන්නා. හිවලා තවත් සින්දුවක් කීවා:

"කොල්ලෝ කෙල්ලෝ ඇවිල්ලා
සෑම තැනම වී ඉහලා
කිකිළියෝ ඒවා කාලා
රන් කුකුළට නැහැ කීවා".

කුකුළා රැවටුනේ නැතුව ඉන්නවා. එතකොට හිවලා තවන් සින්දුවක් කීවා:

"ගමරාළලා ඇවිල්ලා
සෑම තැනම මුං ඉහලා
කිකිළියෝ ඒවා කනවා
රන් කුකුළට නැහැ කියනව"

ඉවසා ඉන්ට බැරිවූ කුකුළා ජනේලෙන් එළියට බෙල්ල දමල හඬලෑවා:

"කොක්කෝ කෝ කෝ ඇයි ද අපට නොදෙන්නේ?"

හිවලා එකපාරටම කුකුළා අල්ලාගෙන කැලෑව මැදින් දුවනවා. කඳු අතරින් දුවනවා...

කුකුළා හඬලෑවා, කෑගැහුවා. ඒ වුණාට පූසට ඇහුණෙත් නෑ, කුරුල්ලට ඇහුණෙත් නෑ. දෙදෙනාම පැලට ආවයින් පස්සෙ තමයි, කුකුළා නැති බව දනගන්තෙ.

හිවලා ගිය අඩිපාර දිගේ පූසා දුවන්ට පටන් ගත්තා. කුරුල්ලා පියාසර කළා. දෙදෙනාම හිවලාගෙ ගුහාව ළඟට ආවා. පූසා ගිටාරයක් වාදනය කරලා සින්දුවක් කීවා:

"හිවල් හාමි, හිවල් හාමි
උඹ බලන්ට අපි ආවා
තෑගිබෝග බාරදෙන්ට
එළියට බැහැපන් හනිකට!"

සින්දුව අසන හිවලා මෙහෙම හිතුවා:

"කවුද මේ තරම් හොඳට ගිටාරය ගහන්නෙ, සින්දු කියන්නෙ, ගිහිං බලන්ට ඕන."





ගුහාවෙන් එළියට ආවා විතරයි පූසයි, කුරුල්ලයි ඌ අල්ලා ගත්තා, හපන්ටයි, හූරන්ටයි, කොටන්ටයි, අනින්ටයි පටන් ගත්තා. වේදනාව ඉවසා ගන්ට බැරිව හිවලා පැනලා දිව්වා.

පූසා කුකුළා වඩා ගත්තා. තුන්දෙනාම ගෙදර ගියා. ඔන්න එදා ඉඳලා මේ තුන්දෙනාම හොඳින් ජීවත් වෙනවා.

අලෙක්සෙයි නිකොලාවියෙච් තොල්ස්තෝයි
කුකුළා සහ හිවලා
සිතුවම් - එව්ජනී මිහයිලොවිච් රචෙව්
අනුවාදය - දැදිගම වි. රුද්‍රිගු
(රුසියානු මුල් පිටපතෙනි)

Петушок — золотой гребешок
Алексей Николаевич Толстой
Художник Евгений Михайлович Рачёв
Переводчик Дедигама Ви. Рудригу
Синахальский перевод

wwww.kadullabooks.com

0+

12-

රාක්කය: ළමා පින්තූර පොත්, සුරංගනා කතා, ජන කතා

ISBN: 978-6-246296-33-9
65000
9 786246 296339

කඩුල්ල ප්‍රකාශන

LKR 500.00